---

කාත්තන්කුඩි නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 13 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 24 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 11 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කාත්තන්කුඩි නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ආ) වර්ෂය අවසානයේ අතැති ගබඩා තොග වල අගය භෞතික හරි වැරදි බැලූ වටිනාකම මත නොව පොත් අගය අනුව දක්වා තිබුණි .

(ඈ) නැති වූ පුස්තකාල පොත් වල වටිනාකම වූ රු.23,198 ක් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර තිබුණි.

(ඈ) පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර , 1999 සහ 2000 වර්ෂයන් හිදි පුස්තකාලය සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ලට අදාළව මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපුම් සිදුකර නොතිබුණි.

(ඉ) සභාවේ ශ්‍රමය සහ ද්‍රව්‍ය උපයෝගි කොට ගෙන සමාලෝචිත වර්ෂය තුල සිදු කරන ලද කාර්යයන් හි වටිනාකම සොයා බලා ගිණුම්ගත කර නොතිබුණු අතර මෙම කාර්යයන් සඳහා වෙනම වැඩ පත්‍රිකා පිළියෙල කර නොතිබුණි.

(ඊ) 2012 වර්ෂය සඳහා විවිධ ආයතන මගින් පරිත්‍යාග කරන ලද භාණ්ඩ වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර නොතිබුණි.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.64,660 ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,677,651 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| ( i ) වරිපනම් සහ බදු | 6,720 | 6,106 | 5,275 |
| ( ii ) කල්බදු කුලී | 2,770 | 2,946 | - |
| ( iii ) බලපත්‍ර ගාස්තු | 2,022 | 2,410 | 28 |
| ( iv ) වෙනත් ආදායම් | 10,540 | 10,110 | 476 |

### 2.2.2 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන් ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| ( i ) | උසාවි දඩ | 476,333 |
| ( ii ) | මුද්දර ගාස්තු | 23,158,157 |

### 2.3 අවිධිමත් ගනුදෙනු

ටෙන්ඩර්/මිළ කැඳවීම් පරිපාටිය අනුගමනය නොකොට ග්‍රාමීය මට්ටමේ සැලසුම් රැස්වීම් සඳහා සපයන ලද ආහාරපාන සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම් ලෙස සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරි හට රු.66,600 ක් ගෙවා තිබුණි.

### 2.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

ත්‍රිකුණාමලය, චීන වරායේ අත්හැර දමා තිබූ මඟී යාත්‍රාවක් ප්‍රවාහනය සඳහා පුද්ගලික සමාගමකට රු.323,550 ක් ගෙවා තිබුණු නමුත් එය ප්‍රයෝජනයට නොගෙන වර්ෂයකට අධික කාලයක් නිෂ්ක්‍රියව තිබුණි.

### 2.5 මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා.

සභාව විසින් වාහන උපයෝජනය කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරික්ෂණය විය..

---

(අ) බලය ලත් නිලධාරියෙකු විසින් නියමිත කාලයකට වරක් බැගින් සෑම වාහනයකම ඉන්ධන පරිභෝජනය පරික්ෂා කර නොතිබුණි.

(ආ) රෝද 4 ට්‍රැක්ටර් රථ 04 ක් දීර්ඝ කාලයක සට අළුත්වැඩියා කරමින් පැවතුණි .

(ඇ) ට්‍රැක්ටර් සහ ටේලර් 12 ක් හොඳ තත්ත්වයේ පැවති නමුත් 2012 වර්ෂය තුල එම වාහන භාවිතා කර නොතිබුණි .

(ඈ) පහත විස්තර දක්වා ඇති පරිදි ධාවන තත්ත්වයේ නොපැවති වාහන අපහරනය කිරිම සඳහා කටයුතු කර නොතිබුණි .

| විෂයය . | වාහන අංකය. |
|---|---|
| අත් ට්‍රැක්ටරය | සි සි - 95 |
| රෝද 4 ට්‍රැක්ටරය | 49 - 0319 |
| රෝද 4 ට්‍රැක්ටරය | 49 - 0315 |

3. පද්ධති හා පාලන.

---

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස් කිරිම
(ආ) අත්තිකාරම්
(ඇ) ස්ථාවර වත්කම් නඩත්තුව
(ඈ) අයවැය ලේඛණය

s/s .